# තයොධම්ම සූත්‍රය.

ජාතිය හා ජරාව හා මරණය නැති කිරීමට නම්...
⇑
රාගය, ද්වේෂය, මෝහය නැති කළ යුතුයි. (රහත් වීම.)

රාගය, ද්වේෂය, මෝහය නැති කිරීමට නම්...
⇑
සක්කාය දිට්ඨිය, විචිකිච්ඡාව, සීලබ්බත පරාමාසය නැති කල යුතුයි. (සෝවාන් වීම)

සක්කාය දිට්ඨිය, විචිකිච්ඡාව, සීලබ්බත පරාමාසය නැති කිරීමට නම්...
⇑
අයෝනිසෝමනසිකාරය, කුම්මග්ග සේවනය (වැරදි මග යාම), චිත්තයාගේ ලීනත්වය (හීන වීර්ය, සිතේ මැලි බව) නැති කල යුතුයි.

අයෝනිසෝමනසිකාරය, කුම්මග්ග සේවනය, චිත්තයාගේ ලීනත්වය නැති කිරීමට නම්...
⇑
සිහි මුළාව, අසම්පජඤ්ඤය, චිත්තයාගේ වික්ෂෙපය (සිතේ විසිරෙන බව) නැති කල යුතුයි.

සිහි මුළාව, අසම්පජඤ්ඤය, චිත්තයාගේ වික්ෂෙපය නැති කිරීමට නම්...
⇑
ආර්‍යයින් දක්නට නොකැමැති බව, ආර්‍ය ධර්මය අසන්ට නොකැමැති බව, දෝෂාරෝපණයට ලැදිවීම නැති කල යුතුයි.

ආර්‍යයින් දක්නට නොකැමැති බව, ආර්‍ය ධර්මය අසන්ට නොකැමැති බව, දෝෂාරෝපණයට ලැදිවීම නැති කිරීමට නම්...
⇑
උද්ධච්චය (සිතේ නොසන්සුන්කම), අසංවරය, දුසිල්බව නැති කල යුතුයි.

උද්ධච්චය, අසංවරය, දුසිල්බව නැති කිරීමට නම්...
⇑
අශ්‍රද්ධාව, නොදෙන සුළු බව, කුසීතකම නැති කල යුතුයි.

අශ්‍රද්ධාව, නොදෙන සුළු බව, කුසීතකම නැති කිරීමට නම්...
⇑
නොසැලකිලිබව (අන් අයට ගරු නොකිරීම), අකීකරු කම, පාප මිත්‍රයන් ඇතිබව නැති කල යුතුයි.

නොසැලකිලිබව, අකීකරු කම, පාප මිත්‍රයන් ඇතිබව නැති කිරීමට නම්...
⇑
අහිරිකය (පාපයට ලජ්ජා නොවන), අනොත්තප්පය (පාපය පිහිටක් කොට ගන්නා ස්වභාවය), ප්‍රමාදය නැති කල යුතුයි.